

# අපේ කම.. සොයා...

මේනකා ජයතිලක
ක්වීන්ස්ලන්තය

ලංකාවෙදි ලන්සි කියලා හැඳින්වුණු ඒත් ඕස්ට්‍රේලියාවෙදි නියම සිංහලයන් විදියට ජීවත් වෙන පවුලක් අපේ සහෝදර සහෝදරියන්ගෙ පවුල් සමඟ හුඟක් සමීපව ඇසුරු කරනවා. ඔවුන් මෙහි පදිංචියට ඇවිත් අවුරුදු තිහකටත් වඩා වැඩියිලු. නමුත් එකිනෙකාගෙ කාර්‍ය්‍ය බහුල බව නිසාම කලාතුරකින් මුණ ගැසෙන ඔවුන් පසුගිය දවසෙක හුඟාක් කාලෙකට පසුව මුණ ගැසුණ  වෙලාවෙදි මෙහෙ ජීවත් වන ලංකාවෙ අපේ මිනිස්සු ගැන කතා කරන්න අමතක කළේ නැහැ. මම හුඟක් මෑතකදි මේ රටේ පදිංචියට ආව කෙනෙක් නිසා, ඔවුන් මගේ තොරතුරුත්, මේ රටට මගේ ඇති කැමැත්තත් අහන අතරෙම මෙහෙ ඉන්න මගතොටදි මුණ ගැසෙන අපේ මිනිස්සු කොහොමද කියලත් ඇහුවා. වැඩි වෙනසක් නොදුටුවත් මෙහෙ ඉන්න අපේ මිනිස්සු දිහා බලද්දි මං පැහැදිලිවම දුටුව දෙයක් තමයි සමහර විට මග තොටකදි, බස් නැවතුමකදි නැතිනම් සාප්පු සංකීර්ණයක් තුළදි තවත් අපේම කෙනෙක් දකින අපේ සමහරු ඈත තියාම ඒ ගැන විමසිලිමත් වුණාත් ඒ පුද්ගලයන් සමීප වෙත්ම නොදුටුවාක් මෙන් ඉවත බලාගෙන යෑම.

මෙහෙ ආව දවස්වලම මේ තත්ත්වය මට ලොකු ප්‍රහේලිකාවක් වුණා වගේම සුදු ජාතිකයින් අතර අතළොස්සක් පමණ වන සිංහලයන්ගේ මේ හැසිරීමත්, එක්තරා අන්දමක පුදුමයකුත්  වුණා. නමුත් එබඳු හැසිරීම් වලට ඇති සාධාරණ හේතුත් කිහිප දෙනෙකුම මට පෙන්වා දුන්නා. අප මෙවැනි දේ ගැන කතා කරද්දි මං ඉහත සඳහන් කළ පවුලේ සොයුරා ගැන අපූරු කතාවක් මතක් කළේ මගෙ මල්ලියි. ඒ අනූවේ දශකයලු. මගේ මල්ලී මෙහි ආ අළුත. දිනක් සාප්පු සංකීර්ණයකදී මගේ මල්ලීත්, අහම්බෙන් මුණ ගැසුණු ඉහතින් සඳහන් කළ සොයුරාත් ආගිය තොරතුරු කතා කරමින් සිටියදී ඔවුන් ඉදිරියට ආ සිංහල යුවතියන් දෙදෙනෙකු දුටු අසල්වැසි සොයුරා කීවලු, ' ඔය එන්නෙත් සිංහල දෙන්නෙක්, හැබැයි සිංහල මිනිස්සු දැක්කම එයාලා යන්නෙ බඹ ගාණක් උඩින්' කියලා. සිංහල මිනිස්සු දැක්කම එයාලා යන්නෙ බඹ ගාණක් උඩින්' කියලා. නිහඬවම එය අසා සිටි මල්ලීට ඔහු කිව්වලු ' ඔන්න බලාගෙන ඉන්න, මං කරන දේ ' කියලා. ඇත්තටම මල්ලි හිතුවලු මෙතන ප්‍රශ්ණයක්වත් ඇතිවෙයිද කියලත්. පසුව ඔවුන්ව නොදුටු, නොතකන නියායෙන් මගෙ මල්ලි සමඟ දිගු කතාවකට මුල පිරුව අර සොයුරා, ඒ යුවතියන් දෙදෙන ඔවුන් පසුකරද්දීම 'මුන්ගෙ අම්මට..' යනුවෙන් පටන්ගෙන තිත්ත කුණුහරුප වැලක් කිව්වලු.

අර යුවතියන් දෙදෙනා එකවරම ගැස්සී හැරී බලද්දී අර සොයුරා කිව්වලු, ' ආ.. ඔය යසට සිංහලත් තේරෙන්නෙ' කියලා. මල්ලි වගේම අර යුවතියනුත් ඒ වෙලාවේ පුදුම අපහසුතාවයකට පත් වුණාලු. ඔය එක සිද්ධියක් විතරයි. ඔවුන් සමඟ කතා කරමින් සිටි හෝරා කීපය තුළදී ඔය වගේ සිද්ධීන් කීපයක්ම අසන්නට ලැබුණා.

ඇත්තටම ජාතියක් වශයෙන් මෙවැනි නොරටුන් අතරදී වැඩිපුර එකතු විය යුතු අපේ මිනිස්සු, තම තමන්ටම ලොකුකම් පෙන්වා ගැනීමෙන් ඔවුන්ට අත්වෙන මානසික තෘප්තියක් තියෙනවද? මං දන්න විදියට මේ තත්ත්වය බ්‍රිස්බේන් වලට විතරක් සීමාවෙලා නැහැ. මෑතකදී සිඩ්නි නුවර පදිංචියට ආ මවක් මගේ ලිපියක් ගැන කතා කරන්නට දුරකථනයෙන් මා සමඟ කතා කළ වෙලාවෙදි කිව්වෙත් ඔවැනිම දෙයක්. සිංහලයන් අතර ඇති සුහදත්වය සීමා සහිත බවක්. නමුත්; අනිකෙකු ආශ්‍රයට කාල වේලාවක් නැති වුණාත්, එසේ ආශ්‍රයට යාමෙන් අනවශ්‍ය ප්‍රශ්ණ කරදර ඇතිවේයැයි සිතුණාත් අඩුම තරමේ තමන්ට කිසිම වියදමක් නොයන සිනාවකින්වත් සංග්‍රහ කරන්න තරම් අපේ මිනිස්සු නිහතමානී නොවන්නේ ඇයි? කොයි තරම් ඉංග්‍රීසි ජාතිකයින් අතර සිටියත් චීන ජාතිකයින් එකතුවෙන තැන චීන භාෂාවෙන් කතා කරද්දි, අපේ රටේදි විතරක් නෙවෙයි මෙහෙදි වුණත් ද්‍රවිඩ ජාතිකයින් එකතු වෙන තැනකදි ද්‍රවිඩ භාෂාවට මුල්තැන ලැබුණත් සමහර සිංහලයන් එකතු වෙන තැනක සිංහල භාෂාවට තැනක් නැත්තෙ මිනිසුන්ගේම පුහු මාන්නය නිසාම මිසක් එතැන වෙන හේතුවක්වත්, වෙන ගත යුත්තක්වත් නැහැ කියලයි මට හිතෙන්නෙ.

ඇත්තටම සමහරු තමන්ගේම අයව ආශ්‍රය කරන්නට පැකිළෙන්නටත් ඕන තරම් අත්දැකීම් ඔවුන්ට ඇති. එකිනෙකා පරයා නැගී සිටීම්, තව කෙනෙකු හෙළා දැක කතා කිරීම්  ආදී අප විසින් අපේ ජීවිත තුළින් බැහැර කළ යුතු දේ මේ රටට ආවත් තවමත් සමහරුන් ගෙන් ඉවත් වෙලා නැහැ. එහෙම අයවලුන් සමඟ ආශ්‍රයට නොගොස් දුරස්ව සිටීම කාටත් යහපතක් බව ඇතැම් අයගේ මතයයි. එක අතකින් බලද්දි ඒ මතයෙත් ඇත්තක් නැත්තෙම නෑ. නමුත් ජාතියක් වශයෙන් අප එකතු විය යුත්තේත්, එකමුතු විය යුත්තේත් කාගේ හෝ අඩුපාඩුවක් නැතිනම් පවුල් ප්‍රශ්ණයක් ගැන කතා කිරීමට පමණක්ම නොවේ. ඊටත් එහා ගිය ලෙන්ගතුකමක්, බැඳීමක්, පිහිටවීමක් සෑම ජාතියක් මෙන්ම අප අතරද තිබිය යුතුමය.




